සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2014
ஆண்டிறுதி மதிப்பீடு
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

විභාග අංකය :- ..............................

නම :- ..............................

සැලකිය යුතුයි:

- I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- II කොටසේ පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

## I - කොටස

- නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ශාකයේ මුල්වල ආහාර තැන්පත් කරන බෝගයක් නම්,
(1) රාබු ය (2) නිවිති ය (3) ගෝවා ය (4) ළූණු ය

(02) බිම්මල් වගාවේ දී (හතු) වගා මාධ්‍යය සකස් කර ගැනීම සඳහා යොදාගත හැකි ප්‍රධාන සංඝටක දෙකක් වන්නේ,
(1) කොම්පෝස්ට් හා ගොමය (2) මතුපිට පස් හා කොම්පෝස්ට්ය
(3) පිදුරු හා ලී කුඩු ය (4) කොහුබත් හා දහයියා ය

(03) නිර්පාංශු වගාව සඳහා වෙළඳ පොළෙන් මිලදී ගත හැකි පෝෂක මාධ්‍යයක් වන්නේ,
(1) යූරියා ය (2) ඇල්බට් මිශ්‍රණය ය
(3) කොම්පෝස්ට් ය (4) ඇමෝනියම් සල්ෆේට් ය

(04) බෝග වගා කිරීම සඳහා පාත්තියක් සකස් කිරීමේ ක්‍රියා පිළිවෙල පහත සඳහන් වේ.
A - ලොකු පස්කැට පොඩිකර සියුම් පසක් බවට පත් කිරීම
B - වගා බිම පුරා වැඩී ඇති වල් පැළෑටි ඉවත් කිරීම
C - පස කොටා පස පෙරළීම
D - පළල මීටර් 1ක් පමණ හා භූමියට ගැළපෙන සේ පාත්තියේ දිග සකස් කර ගැනීම
ඉහත තොරතුරු අනුව නිවැරදි අනුපිළිවෙල දැක්වෙන පිළිතුර වන්නේ,
(1) B, C, A, D (2) A, B, C, D (3) C, A, B, D (4) D, A, B, C

(05) පාසල් භූමියක් නිරීක්ෂණය කළ විට පහත දැක්වෙන තත්ත්ව හඳුනාගත හැකි විය.
- විශාල ගස් වටා පස් සේදී මුල් පෑදී තිබීම
- ක්‍රීඩා පිටියේ කාණු හා අගල් සෑදී තිබීම

මෙම තත්ත්වයන් වළක්වා ගැනීමට ගත හැකි පිළියම් වන්නේ,
(1) මුල් පෑදී ඇති ශාක ඉවත් කිරීම
(2) ගල් වැටි යෙදීම හා ජලය බැසයාමට කාණු පද්ධතියක් සැකසීම
(3) ක්‍රීඩා පිටියේ ඇති තණකොළ ඉවත් කිරීම
(4) ගස් වටා පස් යෙදීම



186

(06) මුද්‍රිත පරිපථ පුවරු තැනීම සඳහා අවශ්‍ය රසායන ද්‍රව්‍යයකි.

(1) රට දුම්මල
(2) ෆෙරික් ක්ලෝරයිඩ්
(3) පැලැක් වාර්නිෂ්
(4) බ්‍රාසෝ වීන්





(07) nPn හා PnP ලෙස දෙවර්ගයකට බෙදා එහි E. C හා B ලෙස අග්‍ර තුනකින් සමන්විත උපාංගය වන්නේ,

(1) ධාරිත්‍රකය යි
(2) ට්‍රාන්සිස්ටරය යි
(3) LEDය යි
(4) ප්‍රතිරෝධකය යි

(08) මුද්‍රිත පරිපථ පුවරු පැස්සීමේ දී යොදා ගන්නා පුවරුව වන්නේ,

(1) ව්‍යාපාති පුවරුවයි
(2) ඇලුමිනියම් පුවරුවයි
(3) කොපර් ක්ලැඩ් පුවරුවයි
(4) ඩොට් පුවරුවයි

(09) පහත දැක්වෙන්නේ ඉලෙක්ට්‍රොනික තාක්ෂණයේ දි භාවිත වන උපාංග හතරක සංකේත දැක්වෙන රූපසටහන් වේ. ඉන් ආලෝක විමෝචක ඩයෝඩය දැක්වෙන සංකේතය තෝරන්න.

(1) 
(2) 
(3) 
(4) 

(10) ප්‍රතිරෝධක අගය මැනීමට භාවිත වන ඒකකය වන්නේ,

(1) වොට් (W) ය
(2) වෝල්ට් (V) ය
(3) ඕම් (Ω) ය
(4) ඇම්පියර් (A) ය

The National e-learning Portal for The General Education

- **පහත දී ඇති පිළිතුරුවලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

(වියළීම, වත්කම් මිලට ගැනීම, අධිශීතනය, ව්‍යාපෘති, සේල් ක්‍රමය)

(11) ව්‍යාපාරිකයෙකුට මුදල් ආයෝජනය කළ හැකි මාර්ගයකි ....................................................

(12) සූර්ය තාපය යොදාගෙන ආහාර වලින් ජලය ඉවත් කිරීම .................................................... යනුවෙන් හැඳින් වේ.

(13) නිශ්චිත කාල රාමුවක් සහිත, ප්‍රායෝගික ක්‍රියාකාරකම් රැසකින් සමන්විත වූ යම් ඉලක්කයක් කරා ගමන් කරන ක්‍රියාවලියකි....................................................

(14) භාණ්ඩ තොග වැඩි ප්‍රමාණයක් ඉතිරිව ඇති අවස්ථාවක අනුගමනය කරන අලෙවි ප්‍රවර්ධන ක්‍රමය .................................................... යි.

(15) මාළු, මස් හා අයිස්ක්‍රීම් වැනි දේ ගෘහීය ශීතකරණයක තැන්පත් කරනු ලබන්නේ .................................. කොටසේ ය.

(ලකුණු 2×5 = 10)

- A තීරුවේ අදහසට ගැලපෙන වචන B තීරුවෙන් තෝරා තිත් ඉර මත ලියන්න.

(16) ආහාර. පරිභෝජනයට සුදුසු පරිදි කල් තබා ගැනීම මේ නමින් හඳුන්වයි.
(..........................................................)

(17) බත් වෙනුවට ගතහැකි ආදේශක ආහාරයකි.
(..........................................................)

(18) ජෙලි, යෝගට් හා අයිස්ක්‍රීම් වර්ග සමග ආහාරයට ගත හැකිය.
(..........................................................)

(19) ඉදි ආප්ප, මුරුක්කු හා රොටි ආදිය සෑදීම සඳහා පදමට අනාගත් පිටි මිශ්‍රණය,
(..........................................................)

(20) ව්‍යාපාරයක ලාභාංශ, කොටස්කරුවන් අතර බෙදාදෙන හා ලියාපදිංචි කිරීම අනිවාර්යය වන ව්‍යාපාර වර්ගය.
(..........................................................)

I සීමාසහිත සමාගම්

II පරිරක්ෂණය කිරීම

III සණ පිටි මෝලිය

IV කොස්, දෙල්

V අඹ ප්‍රිසර්ව්

(ලකුණු 2×5 = 10)

## II කොටස

- පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

(01) (i) ඔබේ පංතියේ සිසුන්ට සතියකට වරක් කොළ කැඳ ලබා දීමට සුදුසු ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලෙස පන්තිභාර ගුරුවරයා විසින් ඔබට දනුම් දෙන ලදි.
ඔබ පන්ති නායකයා යැයි සිතා පහත දක්වෙන ක්‍රියාකාරී සැලැස්මට අදාළ ක්‍රියාකාරකම් පහක් සුදුසු පරිදි පෙළ ගස්වන්න.

| අනු අංකය | ක්‍රියාකාරකම් |
|---|---|
| 1 | අවශ්‍ය මෙවලම් සහ උපකරණ සූදානම් කර ගැනීම |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |

(ලකුණු 05)



The National e-learning Portal for The General Education

(ii) කොළ කැඳ ව්‍යාපාතිය ව්‍යාපාරයක් ලෙස සංවර්ධනය කිරීමේ දී මුහුණපෑමට සිදුවිය හැකි ගැටළු තුනක් ලියන්න. (ලකුණු 06)

(iii) කේවල ස්වාමි ව්‍යාපාරයක (තනි පුද්ගල ව්‍යාපාර) ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 04

(02) (i) වෙළඳ පොළෙන් කුළුබඩු මිලදී ගැනීමට ගිය ශිෂ්‍යයෙක් ගුණාත්මක බවට හානි වූ කුළු බඩු වර්ග කිහිපයක් හඳුනාගත්තේ ය. එවැනි ගුණාත්මක බවට හානි වූ කුළු බඩු වල දැකිය හැකි ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) එළවළු කැපීමේ දී ඒවා දුඹුරු පැහැවීම වළක්වාලීමට අනුගමනය කළ හැකි ක්‍රම තුනක් දක්වන්න. (ලකුණු 06)

(iii) (අ) ආහාර ද්‍රව්‍ය කල්තබා ගන්නා ක්‍රම තුනක් ලියන්න. (ලකුණු 03)

(ආ) ආහාර පිසීමේ දී භාවිත කරන කුළුබඩු වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 03)

(03) (i) පාසලේ හෝ ගෙවත්තේ අලංකරණය සඳහා වගා කළ හැකි කෙටිකාලීන මල් වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) බීජ තවාන් කර පැළ ලබා ගැනීමෙන් ඇති වාසි තුනක් ලියන්න. (ලකුණු 06)

(iii) (අ) වල් පැළෑටි මර්දනය කිරීමේ දී බහුලව යොදා ගන්නා ක්‍රම තුනක් ලියන්න. (ලකුණු 03)

(ආ) ඔබ පාසලේදී ඉවත දමන ප්ලාස්ටික් බෝතල් භාවිතයෙන් සාදාගත් අනුයෝගී උපකරණයක් නම් කරන්න. (ලකුණු 03)

(04) ඉලෙක්ට්‍රොනික පරිපථ නිර්මාණයේ දී හා එකලස් කිරීමේ දී එම පරිපථ පෑස්සීම අවශ්‍යය.

(i) (අ) පරිපථ පෑස්සීම සඳහා අත්‍යවශ්‍ය උපකරණය නම් කරන්න.

(ආ) එසේ පෑස්සීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය කුමක් ද? (ලකුණු 04)

(ii) (අ) ප්‍රධාන පරිපථ පුවරු වර්ග තුන නම් කරන්න. (ලකුණු 03)

(ආ) ඉලෙක්ට්‍රොනික පරිපථවලදී තාවකාලිකව විදුලිය ආරෝපනය කර ගබඩාකර ගැනීමට භාවිත කරන උපාංගය කුමක් ද? (ලකුණු 02)

(iii) සංකේත භාවිත කර සරල පරිපථයක රූපසටහනක් ඇඳ උපාංග නම් කරන්න. (ලකුණු 06)

(05) (i) ව්‍යාපාර ආයතනයක් මගින් අලෙවි ප්‍රවර්ධනය සඳහා අනුගමනය කරන ක්‍රියා මාර්ග තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)

(ii) පහත දැක්වෙන වියදම් සෘජු පිරිවැය හා වක්‍ර පිරිවැය ලෙස වගු ගත කරන්න. (ලකුණු 04)
(අමු ද්‍රව්‍ය සඳහා වියදම්, විදුලි බිල්පත්, සේවක වැටුප්, යන්ත්‍ර ක්ෂයවීම්)

| සෘජු පිරිවැය | වක්‍ර පිරිවැය |
|---|---|
| | |